# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

### ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර)- 2009
### 2010 ඔක්තෝබර්

### BMGT E 3025 – කුඩා ව්‍යාපාර කළමනාකරණය

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

**ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

(01) (අ) "සේවකයන් 10 දෙනෙකුට අඩු ව්‍යාපාර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙස සලකයි". ඉහත ප්‍රකාශය සත්‍යද? අදාළ නිර්වචන සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ආ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සතු විශේෂ ගති ලක්ෂණ ඇත. ඒවා මොනවාද?

(ලකුණු 04)

(ඇ) "දකුණු කොරියාව, තායිවානය වැනි රටවල් සිය ආර්ථික සංවර්ධනය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය මත පදනම් කරගෙන ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනයෙන් ශ්‍රී ලංකාවටද බොහෝ සමාජ සහ ආර්ථික ප්‍රශ්න විසඳාගත හැකිය". මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවේද? ඔබගේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

(02) (අ) "ව්‍යවසායකයෝ නිර්මාපකයන් වෙති" මෙම ප්‍රකාශය අදාළ නිර්වචන සහිතව පහදන්න.

(ලකුණු 05)

(ආ) "ව්‍යවසායකයෝ උපදිති, නිර්මාණය නොවේ". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහිද? සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(ඇ) ව්‍යවසායකත්ව වර්ධන ක්‍රියාවලිය පහදන්න.

(ලකුණු 05)

(ඈ) ව්‍යවසායකත්ව සංවර්ධන චක්‍රය, ව්‍යවසායකයන්ට උපකාර වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

(03) (අ) පහත සඳහන් අවස්ථා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට වැදගත්වන්නේ කෙසේද? ව්‍යාපාරික පරිසරය ඇසුරින් පහදන්න.

(i) 2009, මැයි මස ශ්‍රී ලංකාවේ යුධ ජයග්‍රහණය ආයෝජකයන්ට දේශපාලන ස්ථායීත්වයක් ඇති කළේය.

(ලකුණු 03)

(ii) විදේශීය ආනයන භාණ්ඩයන්ට බදු පැණවීමෙන් දේශීය භාණ්ඩ ආරක්ෂා වේ.

(ලකුණු 03)

(iii) රජය කාර්මික ගම්මාන සඳහා ජලය, විදුලිය, අධිවේගී මාර්ග වැනි බොහෝ පහසුකම් සලසයි.

(ලකුණු 03)

(iv) සමාජ හා සංස්කෘතික ආකල්ප නිසා බොහෝ මිනිස්සු නව ව්‍යාපාර ඇරඹීමට මැලි කමක් දක්වති.

(ලකුණු 03)

(ආ) "ව්‍යාපාරික පරිසරයේ ඇතිවන වෙනස්වීම් ව්‍යවසායකයන්ට වැඩි ව්‍යාපාරික අවස්ථා ඇති කරයි". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟවේද?. ව්‍යාපාරික අවස්ථා ප්‍රභවයන් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

(04) පහත සඳහන් සාධක නව ව්‍යාපාරයක් ඇරඹීමේදී වැදගත් වන්නේ කෙසේදැයි පහදන්න.

(අ) ස්ථානයක් තෝරා ගැනිම සහ යටිතල පහසුකම්

(ආ) යන්ත්‍ර සහ උපකරණ

(ඇ) තාක්ෂණික ප්‍රභවයන්

(ඈ) මානව සම්පත් කළමනාකරණය කිරිම

(ලකුණු 20)

(05) (අ) අප ව්‍යාපාරික සැලැස්මක් සකස්කරන්නේ මන්ද? පහදන්න.

(ලකුණු 04)

(ආ) ව්‍යාපාරික සැලැස්මක ඇති මූලිකාංග මොනවාද? උපකල්පිත ව්‍යාපාරයක් තුළ ඒ එකිනෙක විස්තර කරන්න.

(ලකුණු 16)

(මුළු ලකුණු 20)

(06) (අ) නව ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනිමේ මාර්ග මොනවාද?

(ලකුණු 04)

(ආ) ව්‍යාපාරික අවස්ථා පෙරා ලබා ගැනීමේ ක්‍රියාවලිය (Screening process) විස්තර කරන්න.

(ලකුණු 10)

(ඇ) SWOT (Strengths, Weakness, Opportunity, Threats) විශ්ලේෂණයේ වැදගත්කම් මොනවාද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)